තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදිය

**තිලක් රංජිත් සිල්වා එ. ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය**

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/142/2018 -2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතින්හි (ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටිය), රීති අංක 28 යටතේ පවතවාගනෙ යනු ලබන කාර්ය පටිපාටිය- *මමෙ අභියාචන විභාගය 2018.05.09 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.*

**සභාපති** - මහින්ද ගම්මම්පිල මහතා

**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන මහත්මිය

**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා මහතා

**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍ර මිය

**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්-** පියතිස්ස රණසිංහ මහතා

**අභියාචක** - තිලක් රංජිත් සිල්වා

**තොතිසිලත්පාර්ශවය** - නම් කල නිලධාරී, ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය

**පනේසිටීම**

අභියාචක - තිලක් රංජිත් සිල්වා මහතා

පොදු අධිකාරිය - පැමිණ සිටියේ නැත.

| | |
|---|---|
| **තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය:** | 2017.11.21 (2017.11.27 දිනැතිව පොදු අධිකාරියට යොමු කර ඇත) |
| **තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | ප්‍රතිචාරයක් නොමැත |
| **නම්කල නිලධාරියා වෙත අභියාචනය යොමු කල දිනය:** | 2017.12.30 |
| **නම්කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය:** | ප්‍රතිචාරයක් නොමැත |

| | |
|---|---|
| RTIC **කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය:** | 2018.01.08 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක, 2017.11.21 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් 2017.02.13 දින මඩකලපුව පොලොන්නරුව මාර්ගයේ වැලිකන්ද පොලිස් වසමේ රුහුණු කෙත මංසන්ධියේ සිදුවූ රිය අනතුර පිළිබඳව පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. අනතුර සිදු වූ ස්ථානය සහ අනතුර සිදු වූ අකාරය ඇතුළත් පොලිස් පරීක්ෂණයේදී සකස් කරන ලද දළ සටහන, පරීක්ෂණ වාර්තාවහි සහතික කළ ඡායාපිටපත
2. ලොරි රථයෙහි රියදුරු/ ලොරි සහයක අත්අඩංගුවට ගත් දිනය, වෙලාව ඇතුළත් සටහන් වල උධෘත වල සහතික කරන ලද පිටපත්
3. ලොරි රථයේ රියදුරු වෛද්‍ය වාර්තාව ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීතුමා වෙත රැගෙන යාමත්, ආපහු පැමිණි වෙලාවත් සටහන් උධෘත වල සහතික කරන ලද ඡායාපිටපත්
4. ලොරි රථයෙහි රියදුරු වෛද්‍ය වාර්තාව ඇතුළත් ජී.එච්.ටී. පිටපතේ සහතික කරන ලද ඡායාපිටපත්
5. ලොරි රථයේ රියදුරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට රැගෙන යාමේ සහ ආපසු පැමිණීමේ සටහන්වල උධෘත වල සහතික කරන ලද ඡායාපිටපත්
6. පොලොන්නරුව රෝහලේදී 2017.02.14 දින පවත්වන ලද මරණ පරීක්ෂණයේ සටහන්වල උධෘත වල පිටපත්
7. යතුරු පැදියේ සහ ලොරිරථය සම්බන්ධව නඩු බඩු පොතෙහි සටහන් වල සහතික කළ ඡායාපිටපත්
8. මෝටර් රථ පරීක්ෂකතුමා විසින් වාහන පරීක්ෂා කිරීමෙන් පසු පොලිසිය වෙත ලබා දෙන ලද පරීක්ෂණ වාර්තාවේ සහතික කළ ඡායාපිටපත

9. මමෙ පරීක්ෂණයට පැමිණි පොලිස් නිලධාරීන්ගේ සාක්කු සටහන් පතේ එදින සටහන් කළ කාල සටහන් වල සහතික කළ පිටපත් -
10. මමෙ පරීක්ෂණයට පැමිණි පොලිස් නිලධාරීන් එම පරීක්ෂණයනේ පසුව සේවයනේ බැහැරව ගිය වලොවන්
11. රියදුරු සඳහා තාවකාලික තිකුත් කරන ලද බලපත්‍රයේ අංකය දිනය ඇතුළත් සහතික කළ පිටපත
12. මමෙ අනතුර සම්බන්ධයනේ පොලිස් නිලධාරීන් විසින් ලබා ගන්නා ලද ඡායාරූප වල පිටපත්

තොරතුරු නිලධාරියාගනේ ප්‍රතිචාරයක් නොමැති හේතුවනේ අභියාචක 2017.12.30 දිනැතිව නම්කළ නිලධාරියා වනෙ අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරියාගනේ තීරණයක් නොලැබීම හේතුවනේ අභියාචක 2018.01.09 දිනැතිව කොමිෂන් සභාව වනෙ අභියාචනය යොමුකර ඇත.

**අභියාචනය අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

2017 පබෙරවාරි තුන්වන දින ගැසට් කරන ලද (ගැසට් අංක 2004/66) RTI රීති අංක 20 යටතේ පොදු අධිකාරියට විභාගවාරය සඳහා පනෙීසිටීමට නොතිසි කර තිබුනද එදින අභියාචනය විභාග කරන අවස්ථාවේදී පොදු අධිකාරිය කොමිෂන් සභාව ඉදිරියේ පැමිණීමට අපොහසත් වී තිබුණි.

සිය අභියාචනය කොමිෂන් සභාවට ඉදිරිපත් කළ පසු, පොදු අධිකාරියහෙි තොරතුරු නිලධාරී සිය 2017.11.21 දිනැති තොරතුරු ඉල්ලීම සඳහා 2018.01.17 දිනැතිව ප්‍රතිචාරයක් ලබා දුන් බව අභියාචක කොමිෂන් සභාවට දන්වා සිටියේය. ඒඅනුව තොරතුරු ඉල්ලීමේ අයිතම් 1,2,4,6,7,8 සහ 11 හි විමසා සිටි තොරතුරු අදාළව පොදු අධිකාරිය සැපයූ පිළිතුර සම්බන්ධව සෑහීමකට පත් වන බව අභියාචක ප්‍රකාශ කළේය. එමනේම තොරතුරු ඉල්ලීමේ අයිතම් 3,5 සහ 11 හි විමසා සිටි තොරතුරු අදාළව පොදු අධිකාරිය විසින් සැපයූ තොරතුරු අසම්පූර්ණ හා නොමඟ යවන බවත් තොරතුරු ඉල්ලීමේ අයිතම් 9 සහ 12ට අදාළව පිළිතුරක් සැපයීමට පොදු අධිකාරිය අපොහසත් වී ඇති බවත් අභියාචක වැඩි දුරටත් ප්‍රකාශ කළේය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදිය

පොදු අධිකාරිය, අභියාචක ද පිටපත් කර ඇති, 2018.05.08 දිනැති ෆැක්ස් පණිවුඩය මගින් කොමිෂන් සභාවට දන්වා ඇත්තේ අභියාචක විසින් විමසා ඇති තොරතුරු ප්‍රදානය 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5(1)(ඒ) වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන බවයි. පොදු අධිකාරිය වැඩි දුරටත් එමගින් ප්‍රකාශ කර ඇත්තේ, තොරතුරු ඉල්ලීම පදනම් කරගත් රිය අනතුර සම්බන්ධව පවත්වනු ලැබූ විමර්ශනයට අදාලව සැකකාර රියදුරුට එරෙහිව මාතම්පිටිය මහේස්ත්‍රාත් උසාවියේ නඩුවක් පවරා ඇති බවත්, 2018.04.23 දිනැති නඩු වාරයේදී ගරු මහේස්ත්‍රාත්වරයා පොලිස් පරීක්ෂණයට අදාල ගොනු තුනම නීතිපති දෙපාර්තමේන්තුවට වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම සඳහා තීරණය කිරීමට යොමු කර ඇති බවත් ය. එමනිසාවෙන්, අභියාචක විසින් විමසා ඇති තොරතුරු ප්‍රදානය කිරීම අගතිගාමී වන බවත් අධිකරණයේ නඩු කටයුතු වල අපක්ෂපාතිබව පවත්වාගෙන යාමට අහිතකරව බලපෑ හැකි බවත් පොදු අධිකාරිය විසින් කරුණු දක්වා ඇත.

ඊටඅමතරව, අභියාචක විසින් මෙම පොදු අධිකාරියෙන් අදාල රිය අනතුරෙහි පරීක්ෂණයම පාදක කොටගත් 2017.12.29, 2018.03.05 සහ 2018.04.16 දිනැතිව කරන ලද තොරතුරු ඉල්ලීම් වලදට, කොමිෂන් සභාවේ දැනට විභාග වෙමින් පවතින තොරතුරු ඉල්ලීමට හා සමානව, පොදු අධිකාරියෙන් කිසිඳු ප්‍රතිචාරයක් මෙතෙක් නොලැබී ඇති බව කොමිෂන් සභාවේ අවධානයට භාජනය කරන ලදී.

**නියෝගය**

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ සහ 2017 පෙබරවාරි තුන්වන දින ගැසට් කරන ලද (ගැසට් අංක 2004/66) RTI රෙගුලාසිවලින් නියම කරන ලද නීතිය සහ ක්‍රියාපටිපාටිය, අදාල පොදු අධිකාරිය, පැහැදිලිව උල්ලංඝනය කර ඇත.

පළමුවෙන් ගත කළ, නම්කළ නිලධාරී කොමිසම ඉදිරියේ පෙනී නොසිටි අතර ඔහු වෙනුවෙන් නියෝජිතයෙක් එවීමටද අපොහොසත් විය ඇත. මෙය RTI පනත සහ 2017 පෙබරවාරි තුන්වන දින ගැසට් කරන ලද (ගැසට් අංක 2004/66) RTI රීති උල්ලංඝනය කිරීමකි. තම නොපැමිණීම සම්බන්දව කොමිසමට කිසිම හේතු ඉදිරිපත් කිරීමක් ද සිදුකර නැත. එඅනුව, එවැනි ක්‍රියාකලාපයන්, පනතේ 39 (1) (c) කොටස යටතේ වරදක වන අතර, එම කොටස යටතේම, නිශ්චිත නීතිමය ප්‍රතිවිපාක දරනු ලැබේ.

එවැනි අවස්ථාවකදී, 39 (4) උපකොටස යටතේ, අදාළ උසාවියෙහි නඩු පැවරීමට, කොමිසමට බලය ඇත. තවද, 39 කොටසට අනුව, එවැනි වරදකට වැරදිකරුවූවහොත් කිසියම් දඩ මුදලක් සහ/හෝ වසර දෙකක් නොඉක්මවන කාලයක් සඳහා සිරදඬුවමක් දඩුවම් වශයෙන් නියම කිරීමට නීතියෙන් අවසර ඇත.

පොදු අධිකාරිය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ පහත දක්වා ඇති 5 (1)(ඒ) වගන්තිය යටතේ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කර ඇත.

*5. 1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව*
*එම තොරතුරු හෙළිදරව් කිරීම අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙන යාමට අගතියක් සිදු වන අවස්ථාවක දී*
*මේ පනත යටතේ ඒ තොරතුරු වලට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කළ හැකිය.*

*ලංකා බැංකු සේවක සංගමය එ. මහජන බැංකුව* (2018.01.30 දිනැති RTIC වාර්තා) හි සඳහන් කර ඇති පරිදි, විමසා ඇති තොරතුරු ප්‍රතික්ෂේප කළ හැක්කේ පනතේ 5(1) වගන්තියේ හරය සහ රාමුවට සීමාවී පමණක් බවත් අදාළ ප්‍රතික්ෂේප කිරීම පනතේ 5 (4) වගන්තියේ මහජන සුහසිද්ධියට භාජනය වන අතර 'මහජන සුහසිද්ධිය එම තොරතුරු හෙළිදරව් කිරීමෙන් වන හානියට වඩා වැඩි නම් එවැනි තොරතුරු සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප නොකළ යුතු' බවත්ය.

පනතේ 5(1)(ඒ) වගන්තිය යදිමින් තොරතුරු ප්‍රදානය මුක්ත කර ඇතිනම්, එම ප්‍රතික්ෂේප කිරීම සාධාරණීයකරණය කිරීමට එම මැදිහත්වීම හෝ අගතිගාමීත්වය *අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙන යාමට අගතියක් සිදු කිරීමට* ***සැබෑ අවදානමක්*** (අවධාරණය අප විසින්) පැවතිය යුතු අතර එය හුදු දුරස්ථ ශක්‍යතාවයක් මත සාධාරණීයකරණය කිරීමට නොහැකි වේ.

එමෙන්ම පොදු අධිකාරිය විසින් උපුටා දක්වා ඇති 5(1)(ඒ) වගන්තියෙහි අදාළත්වය මෙන්ම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත පාදක කරගත් මූලධර්මය වන 'උපරිම තොරතුරු අනාවරණය කිරීම' යන්න සළකා බලනවිට, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමෙහි මූලික මූලධර්මය අදාළ කරගනිමින්, 5 (1) උපවගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති ව්‍යතිරේකයන්හට පටු අර්ථනිරූපණයන් දැක්වීමට කොමිෂන් සභාවට යුතුකමක් ඇති බව කොමිෂන් සභාව සැලකිල්ලෙන් නිරීක්ෂණය කරයි.

මේ සම්බන්ධව පොදු අධිකාරියේ දේශනය, විමසා ඇති තොරතුරු සහ එහි හෙළිදරව් කිරීම හේතුවෙන් *'අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීබව පවත්වාගෙන යාමට අගතියක්'* සිදු කිරීමට සැබෑ අවදානමක් ඇති කරන්නේ කෙසේද යන්න සම්බන්ධතාවය දැක්වීමට පැහැදිලිවම අපොහොසත් වී ඇත.

ඒඅනුව, විමසා ඇති තොරතුරු ප්‍රතික්ෂේප කරන්නේ මන්ද යන්න වැඩි දුරටත් කරුණු දක්වා සනාථ කරන ලෙසට පොදු අධිකාරියට නියෝග කර සිටියි. එමෙන්ම, ඊළඟ විභාග වාරයේදී කොමිෂන් සභාවට පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ද රැගෙන කොමිෂන් සභාව ඉදිරියේ අනිවාර්යයෙන්ම පෙනී සිටින ලෙසත් නියෝග කර සිටී.

අභියාචනය මෙලෙස කල් තබනු ලැබේ

ඊළඟ විභාග වාරය: 2018.05.30

****